# මාධ්‍ය නිවේදනය

## ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2022 වර්ෂයේ දෙවන කාර්තුව

## නිෂ්පාදන ප්‍රවේශය

## පදනම් වර්ෂය - 2015

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ දෙවන කාර්තුව (අප්‍රේල් 1 සිට ජුනි 30 දක්වා) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල (2015) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර ප්‍රකාශයට පත් කොට ඇත.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 5,374,716 ක් ලෙස වාර්තා වී ඇත.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ ස්ථාවර මිල(2015) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,782,114 ක් ලෙස වාර්තා වී ඇත.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යාම සියයට 33.3 ක් වන අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සියයට 8.4කින් සංකෝචනය වී ඇත.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 8.4ක්, සියයට 10.0ක් සහ සියයට 2.2ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත.

**පටුන**

**2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබද සාරාංශය - පිටු අංක 2**
**2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබද පසුබිම - පිටු අංක 2**
**2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 3**
**2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 3**
**2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක 4**

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

**සාරාංශය**

2022 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන වේගය සියයට 8.4ක පසුබෑසීමක් ලෙස වාර්තා වී ඇති බවයි.

ඒ අනුව, 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,038,855 ක් ලෙස වාර්තා වූ අතර එය 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 2,782,114 ක් දක්වා අඩු වී ඇත. එසේ වුව ද මෙම අගය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිත වටිනාකම ලෙස වාර්තා වූ රුපියල් මිලියන 2,612,069 ට සාපේක්ෂව ඉහළ අගයක පවතී.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඇස්තමේන්තු කෙරෙන්නේ ඊට පෙර වර්ෂයේ එනම් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට සාපේක්ෂවයි. 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අතර කාලයේ දී දෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වී ඇති ආකාරය පහත රූප සටහනෙහි දැක්වේ.

රූප සටහන 1 - දෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2018 - 2022




තව ද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 4,032,171 ක් ලෙස වාර්තා වූ අතර එය 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 5,374,716 ක් දක්වා සියයට 33.3 කින් වැඩිවී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 10.2 ක්, සියයට 32.0 ක්, සියයට 49.4 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 8.4 ක් ලෙස වාර්තා වේ.

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 8.4ක්, සියයට 10.0ක් සහ සියයට 2.2ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## පසුබිම

කෝවිඩ්-19 වසංගතය ශ්‍රී ලංකාව තුළ 2020 වර්ෂයේ පළමු කාර්තුවේ අවසාන භාගයේ සිට ගතවූ කාර්තු හතක පමණ කාලය පුරා විටින් විට ඉස්මතු වෙමින් ආර්ථික කටයුතු සඳහා බාධාකාරී තත්ත්වයන් ඇතිකිරීමට සමත් වූ අතර 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ ඇස්තමේන්තු සංසන්දනය කෙරෙන 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ද එහි බලපෑම තවදුරටත් පැවතුණි. කෙසේ වෙතත් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෝවිඩ් -19 වසංගතය නිසා ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් සෘජුව එල්ල වූ තත්ත්වයක් දැකගත නොහැකි වූ නමුත් සිවිල් සමාජයේ පැවති අසහනකාරී තත්ත්වය සමග ගොඩනැගුණු අවිනිශ්චිත මෙහෙයුම් පරිසරය හේතුවෙන් බොහෝ ආර්ථික කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට නොහැකි විය.

විශේෂයෙන් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පැවති අර්බුදකාරී තත්ත්වය, පොහොර සහ කෘෂිරසායනික ද්‍රව්‍ය හිගය, ඉන්ධන සපයාගැනීම සම්බන්ධයෙන් පැවති ගැටලු, සිමෙන්ති ඇතුළු අමුද්‍රව්‍ය වල පැවති හිගය සහ මිල ඉහළ යාම, මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් පැවති බාධාවන් සහ ඉහළ උද්ධමනය මගින් ඇති කළ පීඩනය හමුවේ අත්‍යවශ්‍ය නොවන සේවාවන් සඳහා පොදු මහජනතාවගේ ඉල්ලුම අඩුවීම හේතුවෙන් කෘෂිකර්මාන්ත, කර්මාන්ත මෙන්ම සේවා සැපයීමේ කටයුතුවලට මෙම කාර්තුවේ දී බාධා ඇති විය.

ඉහත ගැටළු හේතුවෙන් දැඩිව බලපෑමට ලක්වූ ආර්ථික කටයුතු අතරින් කිහිපයක් ලෙස ධාන්‍ය වගා කිරීම, වී වගා කිරීම, එළවලු වගා කිරීම, තේ වගා කිරීම, රබර් වගා කිරීම, කරදිය මසුන් ඇල්ලීම, පතල් හා කැණීම් කර්මාන්තය, ආහාර හා බීම වර්ග නිෂ්පාදනය ඇතුළුව බොහෝ නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම් කර්මාන්තය, මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම සඳහන් කළ හැකිය. මේ හැරුණු කොට තවත් බොහෝ ආර්ථික කටයුතු සඳහා මෙම බාධාවන් සෘජුව හෝ වක්‍රව බලපෑම් එල්ල කරනු දැකගත හැකි විය. මේ හේතුවෙන් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී බොහෝ කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත ආර්ථික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒවායේ නිෂ්පාදනය අඩුවීමක් සහ ආර්ථිකය තුළ සේවා සඳහා ඉල්ලුම අඩුවීමක් වාර්තා විය.

## කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 11.2ක ධන වර්ධනය හා සසඳන විට, 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 8.4 ක පසුබැසීමක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික කටයුතුවල වාර්තා වී ඇති මෙම පසුබැසීම තුළ 'ධාන්‍ය වගා කිරීම' (සියයට 32.3), 'තේ වගා කිරීම' (සියයට 19.7), 'වී වගා කිරීම' (සියයට 15.6), 'කරදිය ධීවර කටයුතු' (සියයට 15.3), 'රබර් වගා කිරීම' (සියයට 13.7), 'සත්ව නිෂ්පාදනය' (සියයට 13.6) සහ 'එළවළු වගා කිරීම' (සියයට 13.2) ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුවේ දී 'මිරිදිය ධිවර කටයුතු (සියයට 11.2), 'පැළ බෝකිරීම හා කෘෂිකාර්මික සහාය කටයුතු (සියයට 10.8), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 10.5), වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 9.0), 'අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම (සියයට 3.5) සහ 'කුළු බඩු වගා කිරීම' (සියයට 3.2) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්

පසුගිය වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 21.6 ක් වූ ඉහළ ධන වර්ධනය හා සසඳන විට 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සමස්ත කාර්මාන්ත කටයුතු සියයට 10.0 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. එහිදි පෙර වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සමස්ත නිමවුම් කර්මාන්තය සියයට 5.3 පමණ පසුබෑසීමක් වාර්තා කර ඇත. ඊට අයත් ප්‍රධාන නිමැවුම් කර්මාන්තයක් වන 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන' සියයට 28.2ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර මීළඟ ප්‍රධාන නිමැවුම් කර්මාන්තය වන ‘ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය’ සියයට 11.0 ක පසුබෑසීමක් වාර්තා කර ඇත.

ඊට අමතරව, 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' සියයට 78.0 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර 'දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 40.1), 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 28.6), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 28.4),‘රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන' (සියයට 17.7) ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදී 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' සහ 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' යන නිමැවුම් කර්මාන්ත ද්විත්වය පිළිවෙලින් සියයට 3.3 ක් සහ සියයට 0.2 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් දළ දේශීය නිෂ්පාදිතයට සියයට 9.5 ක පමණ දායකත්වයක් ඇති ‘ඉදිකිරීම් කර්මාන්තය’ සියයට 16.2 ක පසුබෑසීමක් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදිතයට සියයට 2.0ක පමණ දායකත්වයක් ඇති ‘පතල් හා කැනීම්’ කර්මාන්තය ද සියයට 26.7ක පසුබෑසීමක් වාර්තා කර ඇත.

මේ අතර, ‘විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම’ සියයට 1.5 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර ‘ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම’ සියයට 20.6 ක ධන වර්ධනයක් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

## සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 2.2 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර එහිදී 'මූල්‍ය සේවා' සහ 'රක්ෂණ සේවා' පිළිවෙලින් සියයට 19.5ක් සහ සියයට 16.8ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත. තවද 'වෘත්තීය සේවා'(සියයට 9.7), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්'(සියයට 8.4), 'සෞඛ්‍ය සේවා' (සියයට 7.5),

'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 6.0), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 0.7) වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර විශේෂයෙන් 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' සියයට 4.3 ක පසුබෑසීමක් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත. තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සැපයීම 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.9ක දායකත්වයක් සපයනු ලබන අතර මෙම කාර්තුවේ දී වාර්තා වී ඇති මෙම පසුබෑසීම කෙරෙහි විශේෂයෙන් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පැවති දුෂ්කරතා, ඉන්ධන හිඟය, විදේශ මුදල් සම්බන්ධයෙන් පැවති සීමා කිරීම්, අවිනිශ්චිත මෙහෙයුම් වටපිටාව සහ සිවිල් සමාජය තුළ පැවති අසහනකාරී තත්ත්වය බලපා ඇත.

තව ද සේවා ආර්ථික කටයුතු අතුරෙන් ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ (සියයට 35.3), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 11.7), 'විදුලි සංදේශ සේවා' (සියයට 8.6), 'අධ්‍යාපනය' (සියයට 5.0), 'අනෙකුත්

පෞද්ගලික සේවා' (සියයට 2.0) සහ 'තොග හා සිල්ලර වෙළදාම' (සියයට 1.7) ක් වශයෙන් ධන වර්ධන වේගයන් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015



පී.එම්.පී.අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්

---

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශිලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+94 11 2147071
+94 11 2877938